# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

[සහතිකය සටහන් කළේ 1975 අප්‍රේල් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 අප්‍රේල් මස 24 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

[සහතිකය සටහන් කළේ 1975 අප්‍රේල් මස 10 වන දින]

එල්.ඩී.—ඕ. 21/73.

**සමාජ ශාලා පාලනය කිරීම සඳහා සහ එයට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි ''නියමිත දිනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

බලපත්‍ර නොලත් සමාජ ශාලා පවත්වා ගෙන යෑම තහනම් කිරීම.

**2.** (1) යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා තුළ වූ කිසිම සමාජ ශාලාවක්—

(අ) එය නියමිත දිනයට පෙර ආරම්භ කරනු ලැබ ඇත්තේ නම්, එම පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ මිස එකී දිනයෙන් පසු මාස තුනක් ඉකුත්වීමෙන් අනතුරුව පවත්වා ගෙන නොයා යුතු ය, නැතහොත්

(ආ) එය නියමිත දිනයෙහි හෝ එම දිනයෙන් පසුව ආරම්භ කරනු ලැබ ඇත්තේ නම්, එම පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ මිස එය ආරම්භ කරනු ලැබූ දිනයෙන් පසු මාස දෙකක් ඉකුත් වීමෙන් අනතුරුව පවත්වා ගෙන නොයා යුතු ය.

(2) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම—

(අ) පිටපත් තුනකින් පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා වෙත යැවිය යුතු ය ;

(ආ) ලියවිල්ලකින් විය යුතු ය ;

(ඇ) 5 වන වගන්තිය යටතේ නිදහස් කරනු ලැබීමකට හිමිකම් පාන අවස්ථාවක දී හැර, උචිත බලපත්‍ර ගාස්තුව සහ රුපියල් දහයක ඉල්ලුම් පත්‍ර ගාස්තුව සමග විය යුතු ය ; තව ද

(ඈ) එම බලපත්‍රය අවශ්‍යව ඇත්තේ යම් සමාජ ශාලාවක් සම්බන්ධයෙන් ද ඒ සමාජ ශාලාවේ ලේකම්, සභාපති හෝ කළමනාකරු විසින් අත්සන් කර තිබිය යුතු අතර ඒ ලේකම්, සභාපති හෝ කළමනාකරු පදිංචි ස්ථානයේ ලිපිනය සහ සමාජ ශාලා ස්ථානයෙහි පිහිටීම එම ඉල්ලීමෙහි ඇතුළත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය කඩ කරමින් යම් සමාජ ශාලාවක් පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක ඒ සමාජ ශාලාවේ ලේකම්, සභාපති හෝ කළමනාකරු යන මේ එක් එක් තැනැත්තා මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

2—ඒ 12383 — 11958 (75/02)

බලපත්‍රයේ ආකෘතිය හා වලංගු කාලය.

3. පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් එම ආයතනය විසින් නියම කරනු ලබන ආකෘතියක විය හැකි ය. තව ද එම බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ දිනයෙන් පසුව එන දෙසැම්බර් මස තිස් එක් වන දින තෙක්, මෙහි 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව එය වලංගුව පවතින අතර අලුතෙන් ඉල්ලුම් කොට වර්ෂයක් පාසා අලුත් කළ හැකි වන්නේ ය.

බලපත්‍රය සඳහා ගෙවිය යුතු ගාස්තු.

4. සමාජ ශාලාවක් පවත්වා ගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය අමාත්‍යවරයා විසින් සෑම පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් නියම කළ හැකි අතර එසේ නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය :

එසේ වුව ද එසේ නියම කරනු ලබන ගාස්තු පහත සඳහන් සීමා නොඉක්ම විය යුතු ය :—

(අ) කොළඹ මහා නගර සභාව සම්බන්ධයෙන් වූ විට ... ... ... රු. 1,000 යි.

(ආ) වෙනත් යම් මහා නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට ... ... රු. 600 යි.

(ඇ) යම් නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට ... රු. 400 යි.

(ඈ) යම් සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් සම්බන්ධයෙන් වූ විට ... ... රු. 350 යි.

බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් කිරීම.

5. 3 වන, 4 වන සහ 26 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද පහත සඳහන් සංගම් බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් වන්නේ ය :—

(අ) හුදෙක් සම්භාෂණ, විනෝද හෝ සංස්කෘතික කාර්යයන් සඳහා හෝ යම් ක්‍රීඩා කටයුත්තක කාර්යය සඳහා පිහිටුවා ගන්නා ලද සමාජ ශාලාවක් වශයෙන් ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් හෝ ඒ ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් බලය දෙන ලද රාජ්‍ය නිලධරයකු විසින් සහතික කරනු ලැබූ යම් සමාජ ශාලාවක් ;

(ආ) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවකයන්ට පමණක් සාමාජිකත්වය සීමා කර තිබෙන්නා වූ ද, එය එසේ බවට ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් හෝ ඒ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා විසින් සහතික කරනු ලැබුවා වූ ද යම් සමාජ ශාලාවක් ;

(ඇ) සභාපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආගමික සංගමයක් ; සහ

(ඈ) යම් පළාත් පාලන ආයතනයක සේවකයන්ට පමණක් සාමාජිකත්වය සීමා කර තිබෙන්නා වූ ද එය එසේ බවට සභාපතිවරයා විසින් සහතික කරනු ලැබුවා වූ ද යම් සමාජ ශාලාවක්.

ඉල්ලීම් ලැබුණු විට සභාපතිවරයා ගතු කාර්ය.

6. බලපත්‍රයක් සඳහා වූ හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් සභාපතිවරයා වෙත ලැබුණු විට ඔහු විසින්—

(අ) එම ඉල්ලීමෙහි පිටපතක් පොලිස් අධිකාරිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(ආ) එම ඉල්ලීමෙහි පිටපතක් සුරා බදු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ; එය ලැබී සති දෙකක් ඇතුළත සුරා බදු කොමසාරිස්වරයා විසින් ඒ පිළිබඳ වාර්තාවක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය ;

(ඇ) පහත සඳහන් පරිදි වූ දැන්වීමක් එනම්—

(i) ඉල්ලීම ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරන්නා වූ හා ඉල්ලුම්කරුගේ නම, සමාජ ශාලාවේ නම සහ සමාජ ශාලාව එහි කටයුතු කර ගෙන යන හෝ කර ගෙන යෑමට අදහස් කරන ස්ථානය සඳහන් කරන්නා වූ ද ;

(ii) එකී සමාජ ශාලාව පිහිටි ප්‍රදේශයේ හෝ එකී සමාජ ශාලාව සඳහා අදහස් කර ඇති ස්ථානය පිහිටි ප්‍රදේශයේ පදිංචිව සිටින එම බලපත්‍රය නිකුත් කිරීම ගැන විරෝධය පෑමට අදහස් කරන යම් තැනැත්තකුගෙන් දැන්වීමේ දිනයෙහි සිට සති හතරක් ඇතුළත ඔහුගේ විරෝධය පෑම සඳහා වූ හේතු පිළිබඳ ප්‍රකාශයක් පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලන්නා වූ ද

දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කිරීමට සැලැස්විය යුතු ය.

පොලිස් අධිකාරිවරයාගේ වාර්තාව.

7. 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ වූ යම් ඉල්ලීමක පිටපත පොලිස් අධිකාරිවරයා වෙත ලැබුණු විට අවස්ථාවෝචිත පරිදි බලපත්‍රය නිකුත් කිරීම නැතහොත් අලුත් කිරීම තමා නිර්දේශ කරන්නේ ද නැද්ද යන වග ප්‍රකාශ කරමින් හා ඒ සඳහා තම හේතු දක්වමින්, එම පිටපත තමා වෙත ලැබීමෙන් සති දෙකක් ඇතුළත ඔහු විසින් සභාපතිවරයා වෙත වාර්තාවක් යැවිය යුතු ය.

විරෝධතා ප්‍රකාශයේ පිටපතක් ඉල්ලුම්කරු වෙත භාර දිය යුතු බව.

8. යම් ඉල්ලීමක් පිළිබඳව 6 වන වගන්තියේ (ඇ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද සෑම විරෝධතා ප්‍රකාශයක ම පිටපතක් ඔහු විසින් ඉල්ලුම්කරු වෙත භාර දෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපතිවරයා විසින් නියමය කළ යුතු බව.

9. (1) බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් 6 වන වගන්තියෙහි සඳහන් තැනැත්තන් අතුරින් කිසිවකුගෙන් විරෝධයක් නොලත් අවස්ථාවක සහ පොලිස් අධිකාරිවරයා බලපත්‍රය නිකුත් කිරීම හෝ අලුත් කිරීම නිර්දේශ කරන අවස්ථාවක සභාපතිවරයා විසින් ඉල්ලීමට ඉඩදෙමින් නියමයක් කළ යුතු අතර ඒ නියමයේ පිටපතක් ඉල්ලුම්කරු, පොලිස් අධිකාරිවරයා සහ සුරා බදු කොමසාරිස්වරයා වෙත භාර දීමට ද සැලැස්විය යුතු ය.

(2) බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් 6 වන වගන්තියෙහි සඳහන් තැනැත්තන් අතුරින් කිසිවකු විසින් විරෝධය පා ඇති විටක කරුණු කියා සිටීමේ අවස්ථාවක් ඉල්ලුම්කරුට හා එක් එක් විරෝධය පාන්නාට දීමෙන් පසු ඉල්ලීමට ඉඩ දෙමින් හෝ ඉඩ නොදෙමින් සභාපතිවරයා විසින් නියමයක් කළ යුතු ය. නියමය කරනු ලබන්නේ යම් හේතු මත ද ඒ හේතු පිළිබඳ ප්‍රකාශයක් නියමයෙහි ඇතුළත් විය යුතු අතර නියමයෙහි පිටපතක් සභාපතිවරයා විසින් එහි ඉල්ලුම්කරු, පොලිස්

අධිකාරිවරයා, සුරා බදු කොමසාරිස්වරයා සහ ඉල්ලීම සම්බන්ධයෙන් විරෝධය පා ඇති සෑම තැනැත්තකු වෙත භාර දෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

**සභාපතිවරයාගේ නියමයට විරුද්ධව අභියාචනා කිරීම.**

10. බලපත්‍රයක් සඳහා වූ යම් ඉල්ලුම්කරුවකු, පොලිස් අධිකාරිවරයා, සුරා බදු කොමසාරිස්වරයා හෝ එම බලපත්‍රය නිකුත් කිරීමට විරෝධය පාන යම් තැනැත්තකු සභාපතිවරයාගේ නියමයෙන් සෑහීමට පත් නොවූවහොත් ඔහු විසින්, නියමය තමා වෙත භාර දෙනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත, 12 වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයෙන් එම නියමයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකි ය.

**ඇතැම් අවස්ථාවල දී නියමය ක්‍රියාත්මක නොකළ යුතු බව.**

11. 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක්—

(අ) ඒ නියමයට විරුද්ධව 10 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලය ඉකුත්වන තුරු ; නැතහොත්

(ආ) අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, අමාත්‍යවරයා විසින් නියමය ස්ථිර කරනු ලබන තුරු

බල නොපෑ යුතු ය.

**අභියාචන හේතු පිළිබඳ ප්‍රකාශය.**

12. 10 වන වගන්තිය හෝ 15 වන වගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් ම එම අභියාචනයට හේතු දක්වමින් ලිඛිත ප්‍රකාශයකින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. 10 වන වගන්තිය යටතේ පොලිස් අධිකාරිවරයා හෝ සුරා බදු කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් හැර එවැනි සෑම අභියාචනයක් ම සභාපතිවරයා වෙත යැවිය යුතු අතර රුපියල් පහක වටිනාකමින් යුත් මුද්දරයක් හෝ මුද්දර ඒ සමග විය යුතු ය. එම අභියාචනය තමා වෙත ලැබීමෙන් දින දහයක් ඇතුළත, සභාපතිවරයා විසින්, එම මුද්දරය හෝ මුද්දර අවලංගු කිරීමෙන් පසු එය අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය.

**අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක වන බව.**

13. 9 වන වගන්තිය හෝ 15 වන වගන්තිය යටතේ සභාපතිවරයා විසින් කරන ලද නියමයක් ස්ථිර කරමින් වුව ද අවලංගු කරමින් වුව ද අමාත්‍යවරයා විසින් යම් අභියාචනයක් පිළිබඳව දෙනු ලබන තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය යම් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

**සමාජ ශාලාවක් පිහිටුවා ගැනීමට තැනැත්තන්ට ඇති අයිතිය.**

14. 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය හෝ 13 වන වගන්තිය යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, සම්භාෂණ, විනෝද හෝ සංස්කෘතික කාර්යයන් සඳහා හෝ යම් ක්‍රීඩා කටයුත්තක කාර්යය සඳහා සමාජ ශාලාවක් පිහිටුවා ගැනීමට තැනැත්තන්ට ඇති අයිතිය කෙරෙහි නිසි සැලකිල්ල දැක්විය යුතු නමුදු, එය, මහජන සාමය, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය පවත්වා ගෙන යාමට සහ අසල්වාසී අනික් අයගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීමට යටත්ව විය යුතු ය.

**බලපත්‍ර අවලංගු කිරීම හා ප්‍රත්‍යාදිෂ්ට කිරීම.**

15. (1) පොලිස් අධිකාරිවරයාගේ ලිඛිත වාර්තාවක් පිට යම් සමාජ ශාලාවක්—

(අ) ඒ සමාජ ශාලාව සද්භාවයෙන් සමාජ ශාලාවක් වශයෙන් පවත්වා ගෙන නොයනු ලබන බවට ; හෝ

(ආ) ඒ සමාජ ශාලාවේ ස්ථානය යම් නීති විරෝධී කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන බවට ; හෝ

(ඈ) ඒ සමාජ ශාලාවේ ස්ථානයෙහි බීමත්කම සහ අනිසි හැසිරීම බහුලව පවත්නා බවට ; හෝ

(ඇ) ඒ සමාජ ශාලාවේ සාමාජිකයන් හෝ ඒ සාමාජිකයන්ගේ අමුත්තන් නොවන තැනැත්තන්ට මත් පැන් ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ සමාජ ශාලාවට ඇතුළු වී නතරව සිටීමට අවසර ලැබෙන බවට ; හෝ

(ඉ) සාමාජිකත්වය සඳහා නාම යෝජනා කිරීම හා සාමාජිකයන් වශයෙන් පත් කර ගැනීම අතර යටත් පිරිසෙයින් සති හතරක අන්තරයක් වත් නොමැතිව පුද්ගලයන් සාමාජිකයන් වශයෙන් ඇතුළු කර ගන්නා බවට ; හෝ

(ඊ) ඒ සමාජ ශාලාවේ ස්ථානය ඇතුළත අශ්ලීල විනෝද ක්‍රියා පවත්නා බවට ; හෝ

(උ) ඒ සමාජ ශාලාවේ ස්ථානය දුරාචාර කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන බවට ; හෝ

(ඌ) ඒ සමාජ ශාලාවේ පැවැත්ම අවසන් වී තිබෙන බවට

සභාපතිවරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් නියමයක් මගින් ඕනෑම වේලාවක එහි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයෙහි, එම නියමය කිරීමට පදනම් වූ හේතු පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු අතර එම නියමයෙහි පිටපතක් ඒ සමාජ ශාලාවේ සභාපතිට, ලේකම්ට හෝ කළමනාකරුට භාර දිය යුතු ය.

(3) යම් සමාජ ශාලාවක සභාපති, ලේකම් හෝ කළමනාකරු විසින්, ඒ නියමය තමා වෙත භාර දෙනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත, 12 වන වගන්තියෙහි දැක්වෙන ආකාරයෙන් එකී නියමයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකි ය.

(4) බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරමින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක්—

(අ) ඒ නියමයට විරුද්ධව (3) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලය ඉකුත්වන තුරු ; නැතහොත්

(ආ) අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, අමාත්‍ය වරයා විසින් නියමය ස්ථිර කරනු ලබන තුරු

බල නොපෑ යුතු ය.

16. (1) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද ඒ ස්ථානය කෙරෙහි පහත සඳහන් විධිවිධාන අදාළ වන්නේ ය :— ස්ථානය කෙරෙහි අදාළ වන තත්ත්ව.

(අ) සමාජ ශාලා ගොඩනැගිල්ල ශක්තිමත්ව ඉදි කළ යුතු අතර එය යහපත් තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතු ය ; තව ද එහි සෑම කාමරයක ම ප්‍රමාණවත් වාතාශ්‍රය තිබිය යුතු අතර එළිය සැපයීමේ නිසි පහසුකම් ද තිබිය යුතු ය ;

(ආ) ස්ථානයේ කොටසක් වන ගොඩනැගිල්ලක කිසිම බිත්තියක් උසින් අඩි නමයකට අඩු නො විය යුතු ය ;

(ඇ) ස්ථානයේ කොටසක් වන යම් ගොඩනැගිල්ලක අගුවාසිය, පොළොවෙහි සිට අඩි හතකට අඩු නො විය යුතු ය ;

(ඈ) වහළය ස්ථිර ස්වභාවයේ හෝ අර්ධ ස්ථිර ස්වභාවයේ ද්‍රව්‍යයෙන් තැනිය යුතු ය ;

(ඉ) ස්ථානය සංයුක්ත වන ගොඩනැගිල්ලේ ලී වැඩවල තීන්ත ගෑ යුතු ය ;

(ඊ) සමාජ ශාලා ගොඩනැගිල්ලේ බිම් මාලයේ සිමෙන්ති දැමිය යුතු ය ;

(උ) ස්ථානයට ප්‍රමාණවත් ජලාපවහන පහසුකම් තිබිය යුතු ය ;

(ඌ) ස්ථානයට, බොන ජලය සැපයීම ද ඇතුළුව ප්‍රමාණවත් ලෙස ජලය සැපයීම කළ යුතු ය ;

(එ) ස්ථානයෙහි ආහාර පිසීම කරනු ලබන අවස්ථාවක, දුම් පිටවීමට සෑහෙන මාර්ගයක් ඇති වෙන් වූ කාමරයක් මුළුතැන් ගෙයක් වශයෙන් වෙන් කොට තැබිය යුතු ය ;

(ඒ) ස්ථානය ඇතුළත ඇති වන ගින්නක් නිවීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් වන ස්වභාවයක ගිනි නිවීමේ උපකරණ ඒ ස්ථානය තුළ තබා ගත යුතු ය ;

(ඔ) පළලින් අඩි තිහකට අඩු මාර්ග පථයක් සිට ඒ ස්ථානයට පිවිසීමට ඇති අවස්ථාවක වාහන නවතා තැබීමේ පහසුකම් ස්ථානය තුළ සැලැස්විය යුතු ය.

(2) යම් සමාජ ශාලාවක ස්ථානය (1) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූල නොවන අවස්ථාවක, සභාපතිවරයා විසින් ඒ සමාජ ශාලාවේ සභාපති, ලේකම් හෝ කළමනාකරු වෙත ලිඛිත දැන්වීමක් යවමින් එකී දැන්වීමෙහි දැක්වෙන දිනයට පෙර ඒ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස සභාපතිගෙන්, ලේකම්ගෙන් හෝ කළමනාකරුගෙන් ඉල්විය හැකි ය. සභාපතිවරයා විසින්, ස්වකීය අභිමතය පරිදි, එකී දැන්වීමෙහි දැක්වෙන කාලය දීර්ඝ කළ හැකි ය.

සමාජ ශාලාවක රීති නිශ්චිත කාලයක් ඇතුළත සභාපතිවරයා වෙත යැවිය යුතු බව.

**17.** (1) පහත සඳහන් කරුණුවලට අදාළ විධිවිධාන මේ පනත යටතේ බලපත්‍ර ලත් සමාජ ශාලාවක රීතිවල ඇතුළත් විය යුතු ය :—

(අ) සාමාන්‍ය, ආශ්‍රිත හා සම්මාන සාමාජිකයන් තෝරා පත් කිරීම සහ තාවකාලික සාමාජිකයන් සහ අමුත්තන් ඇතුළත් කර ගැනීම ;

(ආ) සමාජ ශාලාවේ ලේකම් සහ වෙනත් නිලධාරීන් තෝරා පත් කිරීම ;

(ඇ) යම් තැනැත්තකු සාමාජිකත්වය සඳහා නාම යෝජනා කරනු ලැබීම සහ ඔහු සාමාජිකයකු වශයෙන් තෝරා පත් කිරීම අතර සති හතරකට අඩු නොවන අන්තරයක් ;

(ඈ) ගෙවිය යුතු දායක මුදල් ප්‍රමාණය සහ ඇතුළු වීමේ ගාස්තු ප්‍රමාණය ;

(ඍ) සාමාජිකත්වය අවසන් කරන ආකාරය ;

(ඎ) සමාජ ශාලාවේ ස්ථානය විවෘත කර තබන හා වසා තබන දවස් හා වේලාවන් ; සහ

(ඏ) රීති වෙනස් කරන ආකාරය.

(2) අවසර පත්‍රය ප්‍රදානය කරනු ලබන අවස්ථාවේ දී (1) වන උපවගන්තියෙහි දක්වෙන කරුණුවලට අදාළ විධිවිධාන ඇතුළත් රීති සමාජ ශාලාවකට තිබෙන අවස්ථාවක, ඒ සමාජ ශාලාවේ සභාපති, ලේකම් හෝ කළමනාකරු විසින්, අවසර පත්‍රය ප්‍රදානය කරනු ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත, සත්‍ය පිටපතක් බවට ඔහු විසින් සහතික කරනු ලැබූ ඒ රීතිවල පිටපතක් සභාපතිවරයා වෙත යැවිය යුතු ය.

(3) අවසර පත්‍රය ප්‍රදානය කරනු ලබන අවස්ථාවේ දී යම් සමාජ ශාලාවකට රීති නොමැති විට හෝ (1) වන උපවගන්තියෙහි දක්වෙන කරුණු අතුරින් සමහරකට පමණක් අදාළ විධිවිධාන ඇතුළත් රීති ඇති විට හෝ—

(අ) අවසර පත්‍රය ප්‍රදානය කරනු ලැබීමෙන් පසු සති තුනක් ඇතුළත ඒ සමාජ ශාලාවේ සාමාජිකයන් විසින් ඒ කරුණුවලට අදාළ විධිවිධාන ඇතුළත් රීති සෑදිය යුතු ය ; නැතහොත් සංශෝධනය කළ විට ඒ සියලු කරුණුවලට අදාළ විධිවිධාන ඇතුළත් වන ආකාරයෙන් එවකට පවත්නා රීති සංශෝධනය කළ යුතු ය ;

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයෙන් නියමිත පරිදි රීති සෑදීම සම්පූර්ණ කිරීමේ හෝ රීති සංශෝධනය කිරීමේ දිනයෙන් පසු මාසයක් ඇතුළත සමාජ ශාලාවේ සභාපති, ලේකම් හෝ කළමනාකරු විසින්, එසේ සෑදූ හෝ සංශෝධිත රීතිවල පිටපතක් සභාපතිවරයා වෙත යැවිය යුතු ය.

18. මේ පනතේ 16 වන, 17 වන හෝ 19 වන වගන්තිවල සියලු ම විධිවිධාන හෝ ඒවායේ යම් විධිවිධානයක් හෝ කඩ කර ඇති බවට තමා සෑහීමට පත් වන විටක සභාපතිවරයා විසින් ඕනෑම අවස්ථාවක නියමයක් මගින් යම් ස්ථානයක බල පත්‍රය අවලංගු කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි අතර 15 වන වගන්තියේ (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එකී යම් නියමයකට සහ ඒ සම්බන්ධ යම් අභියාචනයකට අදාළ වන්නේ ය.

ඇතැම් අවස්ථාවල දී බල පත්‍ර අවලංගු කිරීම හා ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

19. සෑම සමාජ ශාලා ස්ථානයක ම—

(අ) සියලු ම සංශෝධන සමග, සමාජ ශාලාවේ සභාපති, ලේකම් හෝ කළමනාකරු විසින් අත්සන් කරනු ලැබූ එම සමාජ ශාලාවේ රීතිවල සහ අතුරු ව්‍යවස්ථාවල පිටපතක් ;

(ආ) එක් එක් සාමාජිකයාගේ ලිපිනය දක්වන්නා වූ සහ අවස්ථා චෝචිත පරිදි ඔහුගේ අත්සන නැතහොත් වම් මාපටැඟිලි සලකුණ ඇත්තා වූත් ඔහුගේ දායක මුදල වෙනුවෙන් ඔහු විසින් අන්තිමවරට කරන ලද ගෙවීම සඳහන් කරනු ලැබුවා වූත් සාමාන්‍ය සාමාජිකයන්ගේ නාම ලේඛනයක් ;

පොත්, නාමලේඛන හා ලියකියවිලි ස්ථානයෙහි තබා ගත යුතු බව.

(ඇ) එක් එක් තැනැත්තාගේ ලිපිනය දක්වන්නා වූ හා අවස්ථාවෝචිත පරිදි ඔහුගේ අත්සන නැතහොත් වම් මාපටැඟිලි සලකුණ ඇත්තා වූ තාවකාලික සාමාජිකයන්, සම්මාන සාමාජිකයන් සහ ආශ්‍රිත සාමාජිකයන් යන මොවුන්ගේ වෙනම නාම ලේඛනයක් ;

(ඈ) සමාජ ශාලාවේ සාමාජිකයන්ගේ සියලු ම මහා සභා රැස්වීම්වල දී කරන ලද කටයුතු සටහන් කරනු ලැබූ වාර්තා පොතක් සහ සමාජ ශාලාවේ කාරක සභාවේ සියලු ම රැස්වීම්වල දී කරන ලද කටයුතු සටහන් කරනු ලැබූ වාර්තා පොතක් ; සහ

(ඉ) නියම කරනු ලබන වෙනත් නාම ලේඛන, ගිණුම් සහ ලියකියවිලි ද තබා ගත යුතු ය.

නාම ලේඛන, ගිණුම් සහ ලියකියවිලි පරීක්ෂා කිරීමට ඇති බලය.

**20.** සභාපතිවරයා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ උප පොලිස් පරික්ෂකයකුගේ තනතුරට නොඅඩු තනතුරක යම් පොලිස් නිලධරයකු හෝ පරීක්ෂකයකුගේ තනතුරට නොඅඩු තනතුරක යම් සුරා බදු නිලධරයකු හෝ යම් යුක්ති සහගත වේලාවක සමාජ ශාලාවක ස්ථානයට ඇතුළු වී මේ පනතින් හෝ මේ පනත යටතේ එහි තැබීමට නියමිත සියලු නාම ලේඛන, ගිණුම් හා ලියකියවිලි ඉල්ලා පරීක්ෂා කර බැලීම ද එවැනි යම් නාම ලේඛනයක, ගිණුමක හෝ ලියවිල්ලක සම්පූර්ණ පිටපතක් හෝ ඉන් යම් කොටසක පිටපතක් ඔහු විසින් ගැනීම ද නීත්‍යානුකූල වන්නේ ය.

සුරා බදු ආඥාපනත ආදිය අදාළ වීම.

**21.** සුරා බදු ආඥාපනතේ හෝ අදාළ වන්නා වූ වෙන යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන කඩ කරමින් හෝ ඒ විධිවිධානවලට අනුකූල වන ලෙසට හැර කිසිම මත් පැන් වර්ගයක් යම් සමාජ ශාලාවක ස්ථානය තුළ තබා ගැනීමට, විකිණීමට, සැපයීමට හෝ පරිභෝජනය කිරීමට බලය දීමක් හෝ අවසර දීමක් මේ පනත යටතේ වූ බලපත්‍රයකින් කිසිම ආකාරයකින් සිදුවෙතියි නොසැලකිය යුතු ය.

මේ පනත ශ්‍රී ලංකා පොලිස් හමුදාවේ හෝ යම් නාවික, යුද්ධ හෝ ගුවන් හමුද කැන්ටිමකට හෝ මෙස් භෝජනාගාරයකට හෝ අදාළ නොවන බව.

**22.** ශ්‍රී ලංකා පොලිස් හමුදාවේ හෝ ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූලව රැස්කර ඇති හෝ රඳවා ඇති යම් නාවික, යුද්ධ හෝ ගුවන් හමුදාවක හෝ කැන්ටිමකට නැතහොත් මෙස් භෝජනාගාරයකට මේ පනතේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

බලපත්‍ර ගාස්තු පළාත් පාලන ආයතනයේ අර මුදලට බැර කළ යුතු බව.

**23.** පළාත් පාලන ආයතනයක් විසින් මේ පනත යටතේ අයකර ගනු ලබන සියලු බලපත්‍ර ගාස්තු ඒ පළාත් පාලන ආයතනයේ උචිත අර මුදලට බැර කරනු ලැබිය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

**24.** (1) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක් ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(2) මේ පනත යටතේ දඩයක් නියම කරනු ලැබූ අවස්ථාවක, එම වරද කරන ලද්දේ යම් සමාජ ශාලාවක් සම්බන්ධයෙන් ද එම සමාජ ශාලාව පිහිටි පරිපාලන සීමාව අයත් පළාත් පාලන ආයතනයේ අරමුදලට එම නඩුවෙහි ලා අය කර ගනු ලබන දඩ මුදල ගෙවන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

25. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා සහ නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් කියැවෙන යම් කරුණක් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින්, අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"සභාපතිවරයා" යන්නෙන්—

(අ) එය යම් මහා නගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ මහා නගර සභාවේ නගරාධිපති අදහස් වේ;

(ආ) එය වෙන යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා අදහස් වේ ;

"සමාජ ශාලාව" යන්නෙන් සම්භාෂණ, විනෝද හෝ සංස්කෘතික කාර්යයන් සඳහා හෝ යම් ක්‍රීඩා කටයුත්තක් හෝ එවැනි කාර්යයන් අතුරින් එකිනෙකට සම්බන්ධ යම් කාර්යයන් සඳහා හෝ ආරම්භ කරන ලද සිය කැමැත්තෙන් එකතු වූ පුද්ගලයන්ගේ සමාගමයක් අදහස් වේ ;

"සුරා බදු කොමසාරිස්වරයා" යන්නට බලපත්‍රය අවශ්‍ය වන්නේ යම් සමාජ ශාලාවක් සම්බන්ධයෙන් ද ඒ සමාජ ශාලාව පිහිටි ප්‍රදේශය භාර සුරා බදු අධිකාරිවරයා ඇතුළත් වේ ;

"මත් පැන්" යන්නට සුරා බදු ආඥාපනතේ "මත් පැන්" යන යෙදුමට දී ඇති අර්ථය ම ඇත.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක් නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් ආධාරයක් හෝ ණයක් වශයෙන් නැත හොත් වෙනත් ආකාරයකින් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධනයෙන්, සමාගම් ආඥාපනත නොවන යම් ලිඛිත නීතියකින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් අදහස් වේ ; තවද

"පොලිස් අධිකාරිවරයා" යන්නෙන් බල පත්‍රයක් අවශ්‍යව ඇති සමාජ ශාලාව පිහිටි ප්‍රදේශය භාර පොලිස් අධිකාරිවරයා අදහස් වේ.